# තාඕ දර්ශනයේ පිළිබිඹුවන ශූන්‍ය ක්‍රියාකාරී විශ්ව මාර්ග සහ අදේවවාදී සංකල්පය

මුදිතා කරුණාසිංහ

## හැඳින්වීම

ලෝකයේ සියලු දර්ශන සම්ප්‍රදායන් හෝ චින්තන සම්ප්‍රදායන් ආකස්මිකව ගොඩනොනැගෙන අතර ඒවා සැමවිටම සමකාලීන සමාජ ක්‍රමයට දක්වන්නා වූ ප්‍රතිචාරයක් වෙයි. ඒ නිසා ම ඒවා කාලීන සමාජය පිළිබඳ නිරූපනයක් ද වෙයි. උදාහරණයක් වශයෙන් ක්‍රි.පූ. 5 වන ශතවර්ෂයේ ග්‍රීක සමාජයේ පැවති සමාජ දේශපාලන ව්‍යාකූලත්වයට දක්වන ප්‍රතික්‍රියාවක් වශයෙන් සම්භාව්‍ය ග්‍රීක දර්ශනය බිහිවිය. බෞද්ධ දර්ශනය මේ ආකාරයෙන් ම කාලීන සමාජ දේශපාලන හා මතවාදී ප්‍රතිවිරෝධනයනට දක්වනු ලැබූ ප්‍රතික්‍රියාවක් වශයෙන් සැලකිය හැකිය. ජේසුස් ක්‍රිස්තුතුමන්ගේ දේශනාවන් ද පැහැදිලිව ම යිහුදියෙල් සමාජ පීඩනයට ලබාදුන් පිළිතුරක් විය. මේ ආකාරයෙන් ම චීනයේ ද තාඕ දර්ශනය, කොන්ෆියුසියානු දර්ශනය, ඇතුළු සියක් දාර්ශනික ගුරු කුලයන් (bai jia zhen ming)[1] ක්‍රි.පූ. 8 වන හා 5 වන ශතවර්ෂයන් අතර කාලපරිච්ඡේදයේ පැවති සමාජ දේශපාලන අර්බුදය පසුබිමෙහි බිහිවිය.

චීන දර්ශන ඉතිහාසය, 'චෝ' (zhou- ක්‍රි.පූ. 11-16 ශතවර්ෂයන්), 'චුන්චිව්' (chun qiu ක්‍රි.පූ. 770-476) හා 'චන්ගුවෝ' (zhan guo හෙවත් යුධරාජ සමය ක්‍රි.පූ. 476-256) යනුවෙන් ප්‍රධාන යුග තුනකට බෙදනු ලැබේ. මෙම යුගයන්හි දී චීන දර්ශනයේ සම්භවය, විකාශය හා සම්ප්‍රාප්තිය සිදුවිය. තාඕවාදී දාර්ශනික සංකල්පයන් තේරුම්ගැනීමේ පූර්ව ව්‍යායාමයක් වශයෙන් මෙම දාර්ශනික යුග ත්‍රිත්වයෙන් 'චෝ' හා 'චුන්චිව්' යුගයන්හි සමාජ පසුබිම විමර්ශනය කිරීම සුදුසු ය.

## චීන දර්ශනයේ සමාජ දේශපාලන පසුබිම

චීනයේ චෝ පෙළපත් යුගය චීන ඉතිහාසයේ පරමාදර්ශී රාජ්‍ය පාලනයක් පැවති ස්වර්ණමය කාලපරිච්ඡේදයක් වශයෙන් සලකනු ලැබේ. මේ වනාහි චෝ (zhou) නමැති පෙළපත් නාමයෙන් හැඳින්වුනු චෝ තියැන් ත්ස (zhou tian zi)[2] යන විරුදාවලිය ලත් රජුගේ පාලන බලය පැවතියා වූ යුගයයි. මේ යුගය චීන ඉතිහාසයේ ධර්මය (ren), ආචාර සමාචාර විධීන් (li) හා සමාජ ක්‍රමය (zhou li) ආදීයේ උච්චත ම අවස්ථාවයි. චෝ යුගයේ පැවති සමාජ ධර්මිකාවන් කොන්ෆියුසියස්තුමා කොතරම් අගය කොට සැලකුව ද යත් එතුමා පසු කාලයක දී චෝ යුගයේ පැවති සමාජ ක්‍රමය (zhou li) නැවත ස්ථාපිත කිරීමේ අසාර්ථක ප්‍රයත්නය සඳහා තමන්ගේ මුළු ජීවිත කාලය ම කැප කළේ ය.

මෙම පරමාදර්ශී චෝ රාජ්‍ය චෝ තියැන් ත්ස ගේ පාලන කාලය තුළදීම බිඳවැටී මුළු රට ම ව්‍යාකූලත්වයට පත්විය. මධ්‍යගත රාජ්‍ය බලය ආදිපාදවරුන් හෙවත් තමන්ගේ ම